# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2301/63 – 2022 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා – 2022.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/J/2015/196.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.12.30 දිනැති හා අංක 2208/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කුරුණෑගල, තෝරයාය, දඹුල්ල පාර, අංක 42 හි පදිංචි දිනුක පෙරේරා මයා, සහ කොළඹ 07, ධර්මපාල මාවත, අංක 181/1ඒ හි පිහිටි සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.08.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය**

බේරුම්කරු ආර්. ඒ. තිලකරත්න මහතා ඉදිරිපිටදීය.

ආරාවුල් අංකය : IR/COM/01/J/2015/196.
බේරුම්කරණ අංකය : A/17/2021.

දිනුක පෙරේරා මයා
නො. 42, දඹුල්ල පාර,
තෝරයාය,
කුරුණෑගල,

*පළමුවැනි පාර්ශ්වය.*

*සහ,*

සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්න්ස් පීඑල්සී,
අංක 181/1ඒ
ධර්මපාල මාවත,
කොළඹ 07.

*දෙවැනි පාර්ශ්වය.*

අතර පවතින කාර්මික ආරාවුල.

වර්ෂ 2022 ක් වු ජුනි මස 16 වැනි දින දීය.
පෙනී සිටීම.

| | | |
|---|---|---|
| පලමු පාර්ශවය වෙනුවෙන් | : | පෙත්සම්කරු දිනුක පෙරේරා මයා |
| දෙවන පාර්ශවය වෙනුවෙන් | : | සහභාගිත්වයක් නැත. මැදිහත්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ කමල් දිසානායක මහතා සමග නීතිඥ අනුර දිසානායක මහතා පෙනීසිටී. |

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 2020.12.10 දතම ලිපිය මගින්, 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදනා පනත සමග) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා විසඳිය යුතු කරුණු කම්කරු කොමසාරිස් ජනරාල් වරයා විසින් ඔහුගේ අංක IR/COM/01/J/2015/196 හා 2020.12.08 දින දරණ කාර්මික ආරාවුලට හේතුවූ කරුණ පැහැදිලි කර ඇති වාර්තාවෙහි පහත පරිදි වාර්තා කර ඇත.''සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්න්ස් පීඑල්සී ආයතනයේ සේවකයෙකුව සිටි දිනුක පෙරේරා මහතාට 2013 නොවැම්බර් මස ඉන්ධන වියදම ප්‍රතිපූර්ණය නොකිරීමෙන්ද, 2013 අප්‍රේල් හා මැයි මාස සඳහා වාහන දීමනාව නොගෙවීමෙන්ද, වෛද්‍ය රක්ෂණ ක්‍රමය යටතේ ඉල්ලා සිටින ප්‍රතිලාභ නොගෙවීමෙන්ද, අසාධාරණයක් සිදුවී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේනම් හිමිවිය යුතු සහන කවරේද? යන්න පිලිබඳව වේ.”

දෙවන පාර්ශවය වූ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම මෙම පරීක්ෂණයට සහභාගි නොවීය. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම මූල්‍ය පරිපාලන කටයුතුවලින් ඉවත්කර එහි පරිපාලනය පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම ට භාරදී ඇති බව වාර්තා වූ හෙයින් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමට කැඳවීම් කරන ලදී.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සංජීව බණ්ඩාරනායක මහතා 2021.04.22 දින දරන ලිපියෙන් දැනුම් දී ඇත්තේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2013.07.01 දින සිට සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ කටයුතු පරිපාලනය කිරීම පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමට භාරදුන් බවද නමුත් 2018.03.05 දින සිට එකී කටයුතුවලින් නිදහස් කර ඇති බවද එබැවින් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ කටයුතු සම්බන්ධයෙන් මැදිහත්වීමට බලයක් හෝ වගකීමක් නැති බවයි.

මේ අනුව මෙම පරීක්ෂණය ඒකපාර්ශ්විකව පැවැත්වීමට තීරණය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව කැඳවා මෙම ආයතනය සම්බන්ධ තොරතුරු ලබාගැනීමටද තීරණය කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් නීතිඥ අනුර දිසානායක මහතා පහත තොරතුරු වාර්තා කරන ලදී. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම මහ බැංකුවේ ලියා පදිංචි මූල්‍ය සමාගමකි. එකී සමාගමේ මූල්‍ය කළමණාකරණයේ තිබූ අසතුටුදායක තත්වය මත ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2013.07.01 දින සිට එකී සමාගම කළමණාකරණය කිරීමේ බලය පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමට පවරන ලදී. 2018.03.05 දින සිට පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම එකී වගකීමෙන් නිදහස් කර ඇති අතර මේ වන විට සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, ණගන් බේරා වසා දැමීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ අංක CHC/91/2019/CO දරන නඩුව පවරා ඇත. ඈවරකරුවෙකු පත්කිරීම සඳහා නඩුව නියම කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවට මේ අවස්ථාවේදී කළ හැක්කේ මහාධිකරණය විසින් අවසර ලබාදී ඇති අත්‍යවශ්‍ය වියදම් සිදුකිරීම පමණි. ඒ අනුව මෙම අයදුම්කරුට වන්දි ගෙවීමක් සිදුකිරීමට කාර්මික අධිකරණය තීරණය කරනු ලැබුවහොත් එවැනි ගෙවීමක් සිදුකිරීමට, දැනට නඩුවක් පවත්නා හෙයින් ශ්‍රී ලංකා මහ බැංකුවට බලයක් නැත.

එසේම නීතිඥ අනුර ජයසිංහ මහතා තවදුරටත් ප්‍රකාශ කර සිටියේ බේරුම්කරුගේ තීරණය අනුව පළමු පාර්ශ්වයට යම් ගෙවීමක් කළ යුතුව ඇත්නම් ගරු මහාධිකරණය විසින් පත්කිරීමට නියමිත ඈවරකරු වෙත එම නියෝගය ඉදිරිපත් කරන ලෙසය. ඒ අනුව සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමට අදාළ වත්කම් වගකීම් බෙදාහරින අවස්ථාවේදී ඈවරකරුට කාර්මික අධිකරණයේ තීරණය අනුව ක්‍රියා කිරීමේ හැකියාවක් ඇති බවය.

පළමු පාර්ශ්වය වූ දිනුක පෙරේරා මහතා සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ "සහකාර කළමනාකරු අයකිරීම්" වශයෙන් 2009.10.01 දින සිට පත්වීමක් ලද බවද එම පත්වීම 2010.06.01 දින සිට ස්ථිර කර ඇති බවද ඔහුට මාසික ඉන්ධන වියදම, මාසික වාහන දීමනාව සහ වෛද්‍ය රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම ඇති බවද අදාළ කාලය තුළදී එම දීමනා ලබාගෙන නොමැති බවද ලේඛන හා දිවුරුම් ප්‍රකාශ මගින් තහවුරු කර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් යොමුකරන ලද විසඳිය යුතු ප්‍රශ්ණ සම්බන්ධයෙන් පිලිතුරු පහත පරිදි වේ.

1. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයේ සේවකයෙකුව සිටි දිනුක පෙරේරා මහතාට 2013 නොවැම්බර් මස ඉන්ධන ප්‍රතිපූර්ණය නොකිරීමෙන්ද, 2013 අප්‍රේල් හා මැයි මාස සඳහා වාහන දීමනාව නොගෙවීමෙන්ද, වෛද්‍ය රක්ෂණ ක්‍රමය යටතේ ඉල්ලා සිටින ප්‍රතිලාභ නොගෙවීමෙන්ද, අසාධාරණයක් සිදුවී තිබේද
   පිලිතුර : ඔව්

2. එසේ අසාධාරණයක් සිදුවී තිබේනම් හිමිවිය යුතු සහන කවරේද?

| | |
|---|---|
| 2013 නොවැම්බර් මස ඉන්ධන වියදම ප්‍රතිපූර්ණය සඳහා | රුපියල් 14,500.00 ක්ද, |
| 2013 අප්‍රේල් මාසය සඳහා වාහන දීමනාව ලෙස | රුපියල් 30,000.00 ක්ද, |
| 2013 මැයි මාසය සඳහා වාහන දීමනාව ලෙස | රුපියල් 30,000.00 ක්ද, |
| බිරිඳ රෝහල්ගත වූ වෛද්‍ය බිල්පත් සඳහා | රුපියල් 83,272.00 ක්ද, |
| OPD වෛද්‍ය බිල්පත් සඳහා | රුපියල් 16,000.00 ක්ද, |

වශයෙන් එකතුව රුපියල් 173,772.00ක වන්දි මුදලක් හිමිවිය යුතුය.
(රෝහල් ගතවූ වෛද්‍ය බිල්පත රු. 183,272.00 බවද, එම මුදලින් රු. 100,000.00 මුදලක් බිරිඳගේ රක්ෂණාවරනයෙන් ලද නිසා රු. 83,272.00 මුදලක් පමණක් අයදුම්කර ඇත.)

මේ අනුව මෙම බේරුම්කරණ නඩුවේ පළමු පාර්ශ්වය වූ දිනුක පෙරේරා මහතාට දෙවන පාර්ශ්වය වූ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම විසින්

| | |
|---|---|
| 2013 නොවැම්බර් මස ඉන්ධන වියදම ප්‍රතිපූර්ණය සඳහා | රුපියල් 14,500.00 ක්ද, |
| 2013 අප්‍රේල් මාසය සඳහා වාහන දීමනාව ලෙස | රුපියල් 30,000.00 ක්ද, |
| 2013 මැයි මාසය සඳහා වාහන දීමනාව ලෙස | රුපියල් 30,000.00 ක්ද, |
| බිරිඳ රෝහල්ගත වූ වෛද්‍ය බිල්පත් සඳහා | රුපියල් 83,272.00 ක්ද, |
| OPD වෛද්‍ය බිල්පත් සඳහා | රුපියල් 16,000.00 ක්ද, |

වශයෙන් එකතුව රුපියල් 173,772.00ක වන්දි මුදලක් ගෙවිය යුතු බව තීරණය කරමි.

තවද, එම මුදල මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පලවී මාස තුනක් ඇතුලත මැද කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කිරීම කළ යුතුයි.

එකී සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, එකී සමාගමේ මූල්‍ය කළමණාකරනයේ තිබූ අසතුටුදායක තත්වය මත ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ අංක CHC/91/2019/CO දරන නඩුව පවරා ඇති බැවින්, අධිකරණය විසින් පත් කරනු ලබන ඇවරකරු වෙත මෙම නියෝගය භාරදී ඉදිරි කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

නීතිඥ ආර්.ඒ. තිලකරත්න
බේරුම්කරු

2022 අගෝස්තු මස 08 වැනි දින දීය.

EOG 10-0125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.